# 1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත

අනුමතිය ලැබූ දිනය : 1969 අප්‍රේල් 28

1972 මාර්තු

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

ල්.ඩී.—ඕ. 10/63

**ද්ගලයන්ගේ පදිංචිය සඳහා රජය විසින් හෝ වෙනුවෙන් පයනු ලබන නිවාසවල සන්තකය ආපසු ලබාගැනීම සඳහාත් හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

(අනුමතිය ලැබූ දිනය: 1969 අප්‍රේල් 28)

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී ණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය සහ නුමතිය අනුව හා ඇතිව, එහි ම බලය ප්‍රකාර, අත්‍යුත්තම ාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය පසු ලබා ගැනීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. ලුහුඬු නාමය.

2. මේ පනතෙහි විධිවිධාන— පනත අදාළ වීම.

(අ) සියලු ම රජයේ නිවාසවලට අදාළ විය යුතු ය; තව ද

(ආ) පුද්ගලයන් විසින් එවැනි නිවාසවල පදිංචි වීම පිළිබඳ ගම්‍යමාන කොන්දේසියක් වූ ලෙස හා විය යුතු ලෙස සියලු කල්හි ම සැලකිය යුතු ය.

3. (1) නියම බලධරයකු විසින්, කවර වේලාවක වුවත්, යම් යේ නිවාසයක පදිංචිකරුවකු වෙත, නිවේදනය නිකුත් මට හේතු වූ කරුණු සඳහන් කරමින් තම නිවේදනයෙහි ්චිතව සඳහන් දිනයක ආරම්භ වන එහි ම නිශ්චිතව සඳහන් ාලසීමාව ගතවීමට පෙර— අත් කිරීමේ නිවේදන නිකුත් කිරීමට ඇති බලය.

(අ) ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන්ද සමග ඒ නිවාසය හිස්කොට යන ලෙස; සහ

(ආ) ඒ නිවාසය හිස්කොට එහි සන්තකය ඒ බලධරයාට හෝ නිවේදනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි එවැනි වෙන යම් නියම බලධරයකුට හෝ බලය ලත් තැනැත්තකුට භාර දෙන ලෙස,

පදිංචිකරුට නියම කරන නිවේදනයක් භාර කළ හැකි ය; ෙහොත් භාර කිරීමට සැලැස්විය හැකි ය. නිශ්චිතව සඳහන් සීමාව කවර අවස්ථාවක වුවත් එය ආරම්භ වන දින සිට සයකට අඩු නොවිය යුතු ය.

) (1) වන උපවගන්තිය යටතේ යම් රජයේ නිවාසයක න්ධයෙන් නිකුත් කරනු ලබන සෑම නිවේදනයක් "අත් ම නිවේදනයක්" වශයෙන් මේ පනතෙහි සඳහන් කරනු

) යම් රජයේ නිවාසයක් සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ කිරීමේ නිවේදනයක් ඒ නිවාසයේ ලිපිනයෙහි දී ඒ පදිංචිකරු ලැබෙන පරිදි ලියාපදිංචි කළ ලිපියකින් තැපැල් මඟින් ලැබුවහොත් ඒ නිවේදනය ඒ නිවාසයෙහි පදිංචිකරු වෙත කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) සෑම අස් කිරීමේ නිවේදනයක් මේ පනතට යා කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන "අ" ආකෘතියෙහි විය යුතු ය.

අස් කිරීමේ නිවේදනයක් අනුව ක්‍රියා කිරීමට බැඳී සිටින බව.

4. යම් රජයේ නිවාසයක පදිංචිකරු වෙත අස් කිරීමේ නිවේදනයක් භාර කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ නිවාසය හිස්කොට යැමට ඒ නිවේදනයෙන් එම පදිංචිකරුට නියම කොට ඇති කාලසීමාව ගතවීමෙන් පසුව ඒ නිවාසයෙහි පදිංචිව සිටීමට ඒ පදිංචිකරුට හෝ ඔහුගේ යම් යැපෙන්නකුට හිමිකම් නො ලැබිය යුතු ය; තව ද

(ආ) ඒ පදිංචිකරු විසින් එම නිවාසය හිස්කොට එහි සන්තකය එම කාලසීමාව ගතවීමට පෙර එසේ දෙන මෙන් අස්කිරීමේ නිවේදනයෙන් නියමිත බලධරයාට හෝ තැනැත්තාට භාර දිය යුතුවත් හැර තමාගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද සමග ඔහු ඒ නිවාසයෙන් ඉවත්ව යා යුතු ය.

අස් කිරීමේ නිවේදනය ඉවත් කර ගැනීම හෝ අත්හිටුවීම.

5. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් යම් අවස්ථාවක අස්කිරීමේ නිවේදනය ඉවත් කර ගැනීම හෝ තමා සුදුසු යයි සලකන කාල සීමාවක් සඳහා එය ක්‍රියාත්මක වීම අත්හිටුවීම හෝ කළ හැකි ය.

අස් කිරීමේ නිවේදනයක් අනුව ක්‍රියා නොකිරීමේ ප්‍රතිඵලය.

6. (1) යම් රජයේ නිවාසයක පදිංචිකරු යම් රජයේ නිවාසයක් පිළිබඳව තමා වෙත භාර කරනු ලැබූ යම් අස් කිරීමේ නිවේදනයක් සම්බන්ධයෙන් 4 වන වගන්තියෙහි (ආ) ඡේදයෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරි යම් අවස්ථාවක, යම් නියම බලධරයකු විසින් (ඒ නිවේදනය නිකුත් කළ නියම බලධරයා ඔහු වුවත් නොවූවත්)—

(අ) මෙහි පහත සඳහන් කරුණු, එනම්—

(i) මේ පනතෙහි කාර්යයන් සඳහා තමා නියම බලධරයකු බව,

(ii) ඒ නිවාසයෙහි පදිංචිකරු වෙත (පිටපතක් ඉල්ලීමට අමුණා ඇති) අස් කිරීමේ නිවේදනයක් භාර කරනු ලැබූ බව,

(iii) පදිංචිකරු වෙත ඒ අස්කිරීමේ නිවේදනය භාර කිරීමට හේතු වූ කරුණු, සහ

(iv) ඒ නිවාසය පිළිබඳව එම නිවේදනය සම්බන්ධයෙන් ඉහත කී (ආ) ඡේදයෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීම ඒ පදිංචිකරු විසින් පැහැර හැර ඇති බව

යන මේ කරුණු සඳහන් කරමින්; සහ

(ආ) ඒ නිවාසයෙහි සන්තකය ආපසු ලබා දෙන ලෙසට[illegible] එම පදිංචිකරු සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු [illegible] ඔවුන් ද ඒ නිවාසයෙන් නෙරපන ලෙසටත් අ[illegible]

ඒ නිවාසය පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන සුළු අපරාධ අධිකරණය වෙත මේ පනතට යා කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන "ආ" ආකෘතියෙහි වූ ලිඛිත ඉල්ලීමක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් මේ පනතට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන "ඇ" ආකෘතියෙහි වූත් ඒ ඉල්ලීමෙහි දක්වා ඇති කරුණු තහවුරු කරන්නා වූත් දිවුරුම් පෙත්සමකින් සනාථ කළ යුතු අතර, අස් කිරීමේ නිවේදනයෙහි පිටපතක් ද ඒ සමග යැවිය යුතු ය.

(3) මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන යටතේ දිවුරුම් පෙත්සමකින් සනාථ කරනු ලැබූත් අස් කිරීමේ නිවේදනයෙහි පිටපතක් සමග යවනු ලබන්නා වූත් සෑම ඉල්ලීමක් "නෙරපීම සඳහා වූ ඉල්ලීමක්" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

(4) නෙරපීම සඳහා වූ සෑම ඉල්ලීමක් එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

(5) නෙරපීම සඳහා වූ යම් ඉල්ලීමක් වෙනුවෙන් කිසිම මුද්දර ගාස්තු ගෙවීමක් නො විය යුතු ය.

**නෙරපීම සඳහා වූ ඉල්ලීමක් ලැබුණු විට ක්‍රියා මාර්ගය.**

7. යම් රජයේ නිවාසයක් සම්බන්ධයෙන් නෙරපීම සඳහා වූ ඉල්ලීමක් ලැබුණු විට, ආඥා පත්‍රය නිකුත් කරනු ලැබූ දිනයෙහි සිට සම්පූර්ණ දින තුනකට කලින් නොවූ හෝ සම්පූර්ණ දින හතකට පසුව නොවූ, ආඥා පත්‍රයෙහි නිශ්චිතම සඳහන් දිනයකට පෙර ඒ නිවාසයේ සන්තකය නියම බලධරයාට හෝ ඒ ස්ථානය පිළිබඳ අස් කිරීමේ නිවේදනයෙහි නිශ්චිතව සඳහන් බලය ලත් වෙනත් තැනැත්තාට භාර දෙන ලෙස පිස්කල්ට නියම කරමින් සහ බලය පවරමින් ඒ නිවාසය පිහිටි දිස්ත්‍රික්කයෙහි පිස්කල් වෙත සුළු අපරාධ අධිකරණයක් විසින්, නොපමාවම, සන්තකය භාර දීමේ ආඥා පත්‍රයක් නිකුත් කළ යුතු ය; තව ද අවශ්‍ය වුවහොත් එය නැවත නිකුත් කළ යුතු ය. එකී පිස්කල්ට හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් පොලිස් නිලධරයකුට ඒ පිස්කල් හෝ නිලධරයා අවශ්‍ය යයි සලකන සහායකයන් ද සමග ඒ නිවාසයට ඇතුළු වීම සඳහාත්, ඒ අනුව සන්තකය භාරදීම සඳහාත්, පදිංචිකරුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද සමග පදිංචිකරු ඒ නිවාසයෙන් නෙරපීම සඳහාත් ඒ ආඥා පත්‍රය ප්‍රමාණවත් අධිකාරය වශයෙන් සැලකිය යුතු ය.

**ගෙවල් කුලී සීමා කිරීමේ පනත අදාළ වීමෙන් බැහැර කිරීම.**

8. ගෙවල් කුලී සීමා කිරීමේ පනතෙහි විධිවිධානවල කිසිවක් යම් රජයේ නිවාසයක පදිංචිව සිටින යම් තැනැත්තකු නෙරපීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**අර්ථ නිරූපණය**

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"බලය ලත් තැනැත්තා" යන්නෙන්, යම් රජයේ නිවාසයක් සම්බන්ධයෙන් වූ විට, නියම බලධරයකු නොවන, ඒ නිවාසයෙහි සන්තකය ගැනීම සඳහා ඒ නිවාසය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අස් කිරීමේ නිවේදනයකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ;

"නියම බලධරයා" යන්නෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හෝ ඒ නියෝජ්‍ය ලේකම් විසින් මේ පනතෙහි කාර්යයන් සඳහා නියම බලධරයෙකු වශයෙන් බලය පවරනු ලැබූ වෙන යම් රජයේ නිලධරයෙක් අදහස් වේ;

"යැපෙන්නා" යන්නෙන්, රජයේ නිවාසයක පදිංචිකරු සම්බන්ධයෙන් වූ විට, භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ දරුවා වශයෙන් හෝ අන් ලෙසකින් පදිංචිකරුගෙන් යැපෙන්නකු වූ යම් තැනැත්තකු අදහස් වන අතර, ඒ නිවාසයෙහි විසීමට පදිංචිකරු විසින් අවසර දෙනු ලැබ සිටින වෙන යම් තැනැත්තෙක් ද එයට ඇතුළත් වේ;

"රජයේ නිවාසය" යන්නෙන් යම් තැනැත්තකුට රජය විසින් හෝ වෙනුවෙන් සපයනු ලැබුත් වාසය කිරීමේ කාර්යයන් සඳහා පදිංචි වී ඇති හෝ පාවිච්චි කරනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ කාමරයක් හෝ වෙනත් ඉඩකඩක් අදහස් වන අතර, ඒ ගොඩනැගිල්ල හෝ කාමරය හෝ වෙනත් ඉඩකඩ පිහිටියා වූ යම් ඉඩමක් හෝ ස්ථානයක් ද ඊට ඇතුළත් වේ. එහෙත් ජාතික නිවාස කොමසාරිස් විසින් සපයනු ලැබුත් ජාතික නිවාස පනතේ V වන කොටස අදාළ වන්නාවූත් යම් ගෙයක් ඊට ඇතුළත් නො වේ;

"පදිංචිකරු" යන්නට, මුලින් පදිංචියට ගිය තැනැත්තා මිය ගිය කල්හි, ඒ තැනැත්තාගේ යැපෙන්නෙක් ද ඇතුළත් වේ.

## උපලේඛනය

### "අ" ආකෘතිය

### අත් කිරීමේ නිවේදනය

රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතෙහි කාර්යයන් සඳහා නියම බලධරයකු වූ ............ (නම ද පදවි නාමක් ඇතොත් එය ද සඳහන් කරනු) ............ වන මම, ............ (නිවාසයෙහි ලිපිනය සඳහන් කරනු) ......... දරන රජයේ නිවාසයෙහි පදිංචිකරු වූ ......... (නම ද පදවි නාමක් ඇතොත් එය ද සඳහන් කරනු) ............ වන ඔබට, ............ (දිනය සඳහන් කරනු) ............ වන දින ආරම්භ වන දෙමාසයක කාලසීමාව ගෙවීමට පෙර (හේතුවූ කරුණ සඳහන් කරන්න) නිසා—

(අ) ඔබේ යැපෙන්නන් සිටිවනු වෙතොත් ඔවුන් ද සමග ඒ නිවාසයේ සන්තකය අත් හරින ලෙස; සහ

(ආ) ඒ නිවාසය හිස් කොට එහි සන්තකය මා හට*/හෝ මේ පනතෙහි කාර්යයන් සඳහා නියම බලධරයකු වූ ............ (නම ද පදවි නාමක් ඇතොත් එය ද සඳහන් කරනු) ............ හට*/හෝ ............ (නම ද පදවි නාමක් ඇතොත් එයද සඳහන් කරනු)............ හට භාර දෙන ලෙස,

එකී පනතෙහි 3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියම කරමි.

.......................................................
නියම බලධරයාගේ අත්සන සහ මුද්‍රාව
පදවි නාමක් ඇතොත් එය

දිනය :————.

* නො ගැලපේ නම් කපා හරිනු.

## "ආ" ආකෘතිය

### නෙරපීම සඳහා ඉල්ලීම

................................ සුළු අපරාධ අධිකරණය වෙතට යි. (අධිකරණයේ නම සඳහන් කරන්න).

රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතෙහි කාර්යයන් සඳහා නියම බලධරයකු වූ ............ (නම ද පදවි නාමයක් ඇතොත් එය ද සඳහන් කරනු) ............ වන මම එම පනතෙහි 6 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මේ ඉල්ලීම මගින්—

(අ) පහත සඳහන් කරුණු ඉදිරිපත් කරමි. එනම්:—

(i) මම ඉහත කී නියම බලධරයා වෙමි;

(iii) (පිටපතක් ,මෙම ඉල්ලීමට අමුණා ඇති) අත් කිරීමේ නිවේදනයක් ............ (නිවාසයේ ලිපිනය සඳහන් කරනු) ............ දරන රජයේ නිවාසයේ පදිංචිකරු වූ.........(නම ද පදවි නාමයක් ඇතොත් එය ද සඳහන් කරනු) ............වෙත භාර කරන ලදී;

(iii) ඒ පදිංචිකරු වෙත ඒ අත් කිරීමේ නිවේදනය භාර කරනු ලැබීමට හේතු වූ කරුණ* ............ වේ; තව ද

(iv) ඒ නිවාසය පිළිබඳ එම නිවේදනය සම්බන්ධයෙන් එම පනතෙහි 4 වන වගන්තියේ (ආ) ඡේදයෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීම ඒ පදිංචිකරු විසින් පැහැර හැර තිබේ; එබැවින්,

(ආ) ඒ ස්ථානයෙහි සන්තකය ආපසු ලබා දෙන ලෙසත් ඒ පදිංචිකරු සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද ඒ ස්ථානයෙන් නෙරපන ලෙසත් අයැද සිටිමි.

.........................................

නියම බලධරයාගේ අත්සන සහ ඔහුගේ පදවි නාමයක් ඇතොත් එය.

දිනය :————.

*පදිංචිකරුට රජයේ නිවාසය දෙන ලද කාලසීමාව ගත වී තිබේ ද යන බව, හෝ රජයේ නිවාසයෙහි පදිංචිවීමට ඔහුට සුදුසුකම් ලබා දුන් සේවා ස්ථානයෙන් පදිංචිකරු මාරු කරනු ලැබ සිටී ද යන බව, හෝ රජයේ නිවාසය මුලින් දුන් පදිංචිකරු මිය ගොස් තිබේ ද යන බව නැතහොත් ප්‍රමාණවත් යයි සැලකෙන වෙන යම් හේතුවක් හෝ සඳහන් කරනු.

## "ඇ" ආකෘතිය

......................(නම ද පදවි නාමයක් ඇතොත් එය ද සඳහන් කරනු) ......................වන මම රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතෙහි 6 වන වගන්තියෙන් නියමිත පරිදි—

(අ) එම පනතෙහි කාර්යයන් සඳහා මා නියම බලධරයකු බවත් ;

(ආ) (නෙරපීම සඳහා වූ මගේ ඉල්ලීමට පිටපතක් අමුණා ඇති) අත් කිරීමේ නිවේදනයක්..........................(නිවාසයෙහි ලිපිනය සඳහන් කරනු) ......................දරන රජයේ නිවාසයෙහි පදිංචිකරු වූ ......................(නම ද පදවි නාමයක් ඇතොත් එය ද සඳහන් කරනු) ...................... වෙත එම පනත යටතේ භාර කරනු ලැබූ බවත් ;